පුවත්පත් නිවේදනය

## ත්‍රිකුණාමලයේ තත්ත්වය පිළිබඳව හදිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස කරණ ඉල්ලීම

දිස්ත්‍රික්කයේ සිවිල් නොසන්සුන් තාවයක් පවත්නා බවට වූ වාර්තාවලින් පසු සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සමන්විත වූ කරුණු සොයා බැලීමේ දූත පිරිසක් 2006 අප්‍රේල් 16 සහ 17 දිනවල ත්‍රිකුණාමලයේ සංචාරයක යෙදිනි.

පසුගිය සතිය තුළ ත්‍රිකුණාමලයේ සිදුවී තිබුණු සිද්ධීන් පිළිබඳව වූ මෙම දූත මණ්ඩලයේ අනාවරණයන් අප තුළ දැඩි කනස්සල්ලක් දනවීමට සමත් විය. මෙම සිද්ධීන් හිදී සිවිල් වැසියන් 20ක් මිය ගොස් තිබුණු අතර වෙළඳ සැල් 30ක්ද නිවාස 100ක් ද ගින්නෙන් විනාශ වී තිබුණු අතර පුද්ගලයන් 3000 කට අවතැන්වී පාසල් සහ ආගමික ස්ථානවල රැකවරණය ලබන්නට සිදුවී තිබිණි.

අප්‍රේල් 12 වනදා ත්‍රිකුණාමලය නගරයේ එලවලු වෙළඳපළෙහිදී බෝම්බයක් පිපිරීමෙන් ළමයෙකු ඇතුළු පුද්ගලයන් 5 දෙනෙකු මිය ගියහ. පිපිරීමෙන් විනාඩි 15ක් තුළ ආයුධ සන්නද්ධ සිංහල කලහකාරී පිරිසක් නගරයේ ව්‍යාපාරික ප්‍රදේශවල ප්‍රකෝපකාරී ක්‍රියා මාලාවක් අරඹමින් දෙමළ කඩ සාප්පු ගිනි තැබීම සහ භාණ්ඩ කොල්ල කෑම ඇරඹූහ. සිද්ධීන් බලා සිටි අයගේ විස්තර අනුව, කිසිම නිශ්චිත අවස්ථාවක 100කට වඩා පිරිසක් කලහකාරීන් අතර නොසිටි නමුදු ආරක්ෂක හමුදාවන් විසින් ප්‍රචණ්ඩ ක්‍රියාවන් වැලැක්වීමට කිසිදු සාධාරණ උත්සාහයක් ගෙන තිබුණේ නැත.

12 වනදා පැවති කලබල වලදී වෙළඳ පොලෙහි සහ ඒ අවට පුද්ගලයන් කිහිප දෙනෙකු මරා දමා තිබිණි. ඇතැම් සිරුරු ගිනි ගනිමින් තිබුණු වෙළඳ සැල් තුලට විසි කරනු ලැබිණි. කාන්තාවන් 7 දෙනෙකු ඇතුළු ඝාතනයන් 19ක් මේ දක්වා වාර්තා වී ඇත. කෙසේ නමුත් සංඛ්‍යාවන් දිනෙන් දින වැඩිවෙමින් පවතී. සිරුරු දැවීම මගින් හඳුනාගැනීම ප්‍රමාද වී ඇති අතර සිරුරු විකෘති කිරීමේ හා මරා දැමීමට පෙර ලිංගික අතවරවලට ලක් කිරීමේ සලකුනු විනාශවී ඇත.

වෙළඳ සැල් 30කට වඩා ගිනි ගෙන තිබුණු අතර ඉන් බහුතරය අයත් වූයේ දෙමළ අයට සහ මුස්ලිම් අය දෙදෙනෙකුට ය. විශාල වෙළඳ සැල් කිහිපයක්ම විශේෂයෙන් ඉලක්ක කොට ගෙන තිබුණු බව දක්නට ලැබිණි. හාජි ඉලෙක්ට්‍රිකල්ස්, ඩොලර් ඒජන්සි, ඩයලොග් සමාගම සහ සන්ලයිට් (ලීවර් සහෝදර) ඒජන්සීස් ඒ අතර විය. හැටන් නැෂනල් බැංකුවටද කලහකාරීන් විසින් පහරදෙනු ලැබිණි.

ගිනි තැබීම් සහ මිනිමැරුම් ඇතුළත් වූ අනෙක් සිදුවීම් නගරයෙන් පිටත සිදු වී තිබිණි. නිශ්ශංක නැමැත්තෙකු ලෙස හඳුනාගනු ලැබූ තරුණ සිංහල පුද්ගලයෙකුගේ මල සිරුරක් අප්‍රේල් 14 වනදා "මහින්ද පුර" හිදී හමුවිය. ඔහු 13 වනදා සිට ආගිය අතක් නැතිව තිබිණි. ඉන්පසුව මහින්ද පුරයේ සිංහල ගම් වැසියන් අසල පිහිටි නඩේස පුර දෙමළ ග්‍රාමෙහි ප්‍රකෝපකාරී ක්‍රියාවන් හී යෙදෙමින් නිවාස 40කට ගිනි තැබූහ. ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් තරුණ සංවර්ධන සංවිධානයේ (AHAM) කාර්යාලයට පහර දෙනු ලැබූ අතර ඊට අයත් වාහන කිහිපයකට ගිණි තබනු ලැබිණි. ගමෙහි හින්දු කෝවිලටද පහර දෙනු ලැබිණි. තුවරන් කාඩු හිදීද මීට සමානම සිදුවීම් සිදුවී ඇති අතර එයින් පුද්ගලයන් 1000ක් පමණ අවතැන් වී ඇත. අන්දන්කුලම් වලදී ඇතිවූ සිදුවීම් වලින් නිවාස කිහිපයක් ගිනිබත් විය. අන්දන්කුලම් හී නිවාස අළුත් ඒ වා වූ අතර පස්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමයක් යටතේ ඉදිකරනු ලැබූ ඒවා විය.

ප්‍රචණ්ඩක්‍රියාවන් මෙන්ම සිවිල් වැසියන් විසින් අත්දකිනු ලැබූ බිය සහ අනාරක්ෂිත බව හේතුකොට ගෙන සැලකිය යුතු තරම් විශාල අවතැන් වීමක් සිදුවී තිබිණි. අප්‍රේල් 20 වනදා වන විට ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වාර්තාකළ පරිදි පුද්ගලයන් 2673ක (පවුල් 723ක) අවතැන්වීම් සංඛ්‍යාවක් විය. ඥාතීන් සහ මිත්‍රයන් සමඟ වෙසෙන සහ රාත්‍රී කාලයට වඩා ආරක්ෂිත තැන් සොයා නිවෙස් වලින් ඉවත් වන විශාල සංඛාවන් මෙයට ඇතුළත් නොවේ. පැතිර පවත්නා කැලඹුනු හැඟීම් සහිත තත්ත්වය සහ කාර්ය මණ්ඩල හිඟය කරණකොට ගෙන අවතැන් වීමේ ප්‍රශ්ණයට රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රතිචාරය සිදුවන්නේද සෙමෙන්ය. ජනතාව අවතැන් වීම් අප්‍රේල් 14 වනදා සිදුවූවද ඇතැම් ප්‍රදේශවලට රජයේ සහාය ලැබෙන විට අප්‍රේල් 18 වන දා තරම් විය.

පිපිරීමෙන් පසුව ප්‍රචණ්ඩත්වය පැන නැඟීම සිදුවූ වේගය මඟින් පෙන්නුම් කරනු ලබන්නේ කලින් සැලසුම් සහගත වූ බවක් වන අතර මෙය බෙහෙවින් කනස්සල්ල දනවන සුළුය. සිදුවීම් දුටු දෙදෙනෙකු

සඳහන් කොට සිටියේ තත්ත්වය 1983 ජුලි, දෙමළ විරෝධී ප්‍රචණ්ඩක්‍රියා සිහිගන්වන සුළු වූ බවකි.

ප්‍රචණ්ඩ ගැටුම් දිවා කාලයේ පැය දෙකකට වඩා කාලයක් පැවතිනි. මෙම සමස්ථ කාලය පුරාම සන්නද්ධ හමුදා සහ පොලීසිය ප්‍රචණ්ඩක්‍රියාවන් වැලැක්වීමට කිසිවක්ම නොකළ තරම් විය. ආරක්ෂක හමුදා ඝාතනයන් සහ ගිනිතැබීම් අසල සිටි සහ ඒවාට ඉඩ සැලසු ආකාරය විස්තර කරන ඉතාම විශ්වාසදායක ඇසින් දුටු සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුම වෙති.

සියලුම ප්‍රජාවන්ට අයත් ආගමික නායකයන් විසින් මෙහෙයවනු ලබන බහු වාර්ගික පුරවැසි කමිටුවක් ත්‍රිකුණාමල නගරයෙහි පැවැතියද, එමෙන්ම පොලිසිය විසින් ආරම්භ කරණු ලැබූ සාමකමිටු සෑම ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශයක් මට්ටමේම පැවතියද, මෑතකදී පැවති ප්‍රචණ්ඩ ක්‍රියාවන් ඉදිරියෙහි ඒවා අකර්මන්‍ය ලෙස පැවතිනි. විශේෂයෙන්ම සිංහල සහ දෙමළ ජාතීන් අතර ඉතා ඉහල මට්ටමක අවිශ්වාසයක් සහ සතුරුබවක් පවතී. ජාතිකත්වය පදනම් කොටගෙන කණ්ඩායම් දැවී කරණයවී පවතින අතර සුහදායී සහ සංවර්ධනාත්මක ආකාරයට ඔවුන් එක් කිරීමට හැකියාවක් ඇති ව්‍යුහයක් නොපවතී. ස්ථාවර පදනමක පිහිටි සමාජ ක්‍රියාකාරීන් පවා ප්‍රචණ්ඩත්වය බලපෑ අයට සහය වීම සඳහා ආරම්භක පියවර ගැනීමට බිය පලකළහ. ඇතමුන්ට ඒ වන විටත් තර්ජනාත්මක දුරකථන පණිවිඩ ලැබෙමින් පැවතිනි.

ත්‍රිකුණාමලය සෑම විටකම පාහේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම් ඇවිලෙන ගිණි සිළුවක්ව පැවතී ඇති බැවින් දකුණේ සිවිල් සමාජ සංවිධානවල බලවත් සහ හදිසි යුතුකමක් වන්නේ ඔවුන්ගේ එහි පවත්නා ජාල සම්බන්ධතාවයන් වඩාත් ශක්තිමත් කිරීමටත් එවැනි අළුත් සම්බන්ධතාවයන් ගොඩ නැගීමටත් පියවර ගැනීමට සිය දෑඩි අවධානය යොමු කිරීමය. මේ මගින් මධ්‍යස්ථ සහ සාමයප්‍රිය ත්‍රිකුණාමල වැසියන්ගේ හඬට සත්‍ය වශයෙන්ම බහුත්ව ස්වභාවයක් ලැබෙනු ඇත. එමෙන්ම එමගින් මෘග ජාතිවාදී කැලඹිලිකාරී තත්ත්වයක් වෙත ආපසු තල්ලු වීම වැලැක්වීම සහතික කිරීමට ද පියවර ගත යුතුය.

එම අනාවරණයන් මත පදනම්ව පහත දැක්වෙන සැලකිල්ල යොමු විය යුතු ක්ෂේත්‍රයන් අවධාරණය කොට දක්වීමට සහ රජයට, දේශපාලන පක්ෂවලට, රාජ්‍ය නොවන සංවිධානයන්ට සහ සිවිල් සමාජයේ සියලු සාමාජිකයන්ට ආයාචනය කොට සිටීමට අපි කැමැත්තෙමු.

- ප්‍රචණ්ඩක්‍රියා මගින් අවතැන්වූ අයට අවශ්‍ය සියලු හදිසි සහ මානවවාදී සහාය ලබාදීම සහතික කිරීම සඳහා වහාම පියවර ගතයුතුය. නිවාස නැවත ගොඩ නැගීම ප්‍රමුඛතාවයක් විය යුතුය.

- විශ්වාසය ගොඩ නැංවීමේ පියවරක් ලෙස සියලු ප්‍රධාන දේශපාලන පක්ෂවල ජේෂ්ඨ සාමාජිකයන්ගෙන් සමන්විත නියෝජිත පිරිසක් ත්‍රිකුණාමලයේ සංචාරය කොට එහි ජනතාවගේ සියලු අංශයන් මුණ ගැසිය යුතුය.

- ප්‍රචණ්ඩත්වය වැලැක්වීමට ආරක්ෂක හමුදා අසමත්වීම පිලිබඳ වගකීම පිළිගැනීමට රජය යම් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. රජයෙන් සහ දකුණේ දේශපාලන පක්ෂ වලින් කෙරෙන, සාමුහික සමාව ගැනීමක් ත්‍රිකුණාමලයේ ජනතාව වෙත පුදකර සිටීම සන්නිවේදනයේ බැඳීම් සහ විශ්වාසය නැවත ගොඩ නැංවීම දෙසට වන යෝධ පිම්මක් වනු ඇත.

- අප්‍රේල් 12 වන දා සිදුවූ බෝම්බ පිපිරීමෙන් පසු හටගත් ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිලිබඳව ස්වාධීන පරීක්ෂණයක් ආරම්භ කළ යුතු අතර එවැනි පරීක්ෂණ කණ්ඩායමක් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතුය. සිදුවීම් පිළිබඳ විවිධ සාක්ෂි විස්තරයන් වාර්තා කර ගැනීම සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට යුක්තිය ඉටුකිරීම සහ වන්දි ගෙවීම සම්බන්ධයෙන් රජයට නිර්දේශයන් ඉදිරිපත් කිරීම මෙම පරීක්ෂණයේ අරමුණු විය යුතුය.

- ශ්‍රී ලංකාවේ පැතිර පවත්නා දඬුවම් නොලබා වැරදි කිරීමේ සංස්කෘතිය මෙම පියවරයන් හිදී සැලකිල්ලට ගතයුතු වන අතර පෙර පැවති කොමිශන් සභාවල අත්දැකීම් ද සැලකිල්ලට ගෙන දඬුවම් නො ලබා වැරදි කිරීමේ හැකියාව අවසන් කිරීම සඳහා සංයුක්ත පියවර ගන්නා බවට සහ ඒවා ක්‍රියාත්මක කරන බවට සහතික කිරීමට රජය කටයුතු කළ යුතුය.

- සිවිල් සමාජ සංවිධාන විසින් "ක්ෂණික ප්‍රතිචාර ජාලයක්" නිර්මාණය කළ යුතු අතර ඒමගින් තත්ත්වය නිරීක්ෂණ කිරීම පිණිස ත්‍රිකුණාමලයේ ඔවුන්ගේ "හවුල් කරුවන්" සහ "සගයින්" වෙත නිතිපතා වන සහ ක්‍රමානුකුල සංචාරයන් සිදුකළ යුතුය.

- වන්දි ගෙවීම විනිවිද භාවයකින් යුතුව, අපක්ෂපාතීව සහ බලපෑ සියලු පාර්ශවයන්ට පිළිගත හැකිවන ආකාරයට සිදුකළ යුතුය.
- මෙවැනි අර්බුධකාරී කාලයන් හිදී වඩාත් ඵලදායක ලෙස ක්‍රියාත්මක වීමේ හැකියාව ලබාදීම පිනිස ජාතික මානව හිමිකම් කොමිසමේ දිස්ත්‍රික් කාර්යාලය වැනි ආයතනයන් මානව හා ද්‍රව්‍යමය සම්පත් අතින් ශක්තිමත් කළ යුතුය.
- අධිකාරීන්ගේ පිළිගැනීම සහිතව සහ ස්වාධීනව කටයුතු කිරීමට හැකි වනු පිණිස පුරවැසි කමිටුව ශක්තිමත් කළ යුතුය.

ප්‍රජාව තුළ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ කැලඹිලි සහගත මානසිකත්වය සහ බිය උග්‍ර කරමින් ආරක්ෂක හමුදාවන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම එල්.ටී.ටී.ඊ.ය විසින් සිදුකර ඇතිබව අප කියා සිටිමු.

**අප එල්.ටී.ටී.ඊ.යෙන් ඉල්ලා සිටින්නේ,**

- මෙම ප්‍රචණ්ඩක්‍රියා, නවත්වන ලෙස සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සහ ප්‍රජාතන්ත්‍රික ක්‍රම මගින් ස්වකීය අභිමතාර්ථයන් ඉටුකර ගැනීම පිණිස කැපවන ලෙසය.
- ප්‍රචණ්ඩ ක්‍රියා නිසා අවතැන් වූ අයට හදිසි සහ මානව වාදී සහායයන් සැපයීමට බාධා සිදු නොවන බවට සහතික කරන ලෙස සහ ආයතනයන් සහ පුද්ගලයන් විසින් ක්‍රියාත්මක කරන සහනාධාර වැඩ කටයුතු සඳහා ආරක්ෂිත වටපිටාවක් නිර්මාණය කිරීම පහසුකරණය කරන ලෙසත්ය.

තත්ත්වය පාලනය කොට තබා නොගැනීමේ සහ ත්‍රිකුණාමලයේ වඩා උග්‍රවූ ප්‍රචණ්ඩත්වයකට ඇති ඉඩකඩ අහෝසි නො කිරීමේ අනතුරුදායකත්වය ගැන සියලු දේශපාලන ක්‍රියා නියාමක බලවේගයන් සවිඥ්ඥානකව සිටීම හදිසි අවශ්‍යතාවයකි. තමන්ගේ නිවෙස් සහ ජීවනෝපායයන් වෙත නැවත පැමිණීමට ජනතාවට හැකි වන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. වත්මන් අනාරක්ෂිත වාතාවරණය තුළ දේශපාලන පෙළඹවීමක් සහිත ඇතැම් කණ්ඩායම් විසින් වාර්ගික සහ ආගමික වෛරය ඇවිල වීමට කරණ උත්සාහයන් පිළිබඳව ඉක්මනින් කටයුතු කළ යුතුය. මෙවැනි උපක්‍රමශීලී කුටෝපායයන් පිළිබඳව සියලු පුරවැසියන් වඩාත් සුපරීක්ෂාකාරීව සිටීම කළ යුතුය. මේ මොහොතේ සාම ක්‍රියාදාමයේ පවතින සියුම් සහ දුර්වල ස්වභාවය නිසා සටන් විරාම ගිවිසුම ආරක්ෂා කිරීමට සහ ශ්‍රී ලංකාවේ සාමය සඳහා වන හඬවල් ශක්තිමත් කිරීමට එක්සත් ක්‍රියාමාර්ග ගනු ලැබීමේ අවශ්‍යතාවය බලවත් ලෙස ඉස්මතුවී ඇත.

සුනිලා අබේසේකර, උදය කළුපතිරණ : INFORM

පාක්‍යසෝති සරවනමුත්තු, රොහාන් එදිරිසිංහ, දේවනේසන් නේසයියා, භවානි ෆොන්සේකා, මිරාක් රහීම් : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,**

රමණී මුත්තෙට්ටුවගම : නීතිය හා සමාජය භාරය, පී.ඩී. ගුණතිලක : දේවසරණ සංවර්ධණ කේන්ද්‍රය, බුද්ධික වීරසිංහ : **නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, අම්බිකා සට්කුනනාදන්,**

සුන්දරී ඩේවිඩ්, චාරන් රේන්ෆෝඩ්, නිමන්ති රාජසිංහම්, සොනාලී මුණසිංහ, පී. තම්බිරාජා, එස්. වරදරාජන්: **ජනවාර්ගික අධ්‍යයනයන් පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය**,

නිමල්කා ප්‍රනාන්දු : **වාර්ගික වෙනස්කම් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය,**

කුමුදුනී සැමුවල්, සේපාලී කෝට්ටේගොඩ : **කාන්තාව සහ මාධ්‍ය සාමුහිකය,**

ජයදේව උයන්ගොඩ : **සමාජ විද්‍යාඥයන්ගේ සංගමය, රුක්ශානා නානායක්කාර : ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල් - ශ්‍රී ලංකා,**

අනිටා නේසයියා, මනෝරී මුත්තෙට්ටුවගම, ධාරනි රාජසිංහම්, තරුමිණි විජේකෝන් : **සමන්තා, ජවහර්ලාල් නේරු විශ්ව විද්‍යාලය**

2006 අප්‍රේල් 21දා